සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

Royal College - Colombo 07
රාජකීය විද්‍යාලය - කොළඹ 07

Grade 10 – First Term Test – July 2023
කාලය : පැය 1
Time: 1 hour
පළමු වාර පරීක්ෂණය - 2023 ජූලි - 10 ශ්‍රේණිය

පුරවැසි අධ්‍යාපනය - I

Name: - ..... Class: -..... Index no: - .....

- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 40 දක්වා වූ ප්‍රශ්නවල දී ඇති පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

01. අතීතයේ සෘජු ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ පදනම් කරගනිමින් පාලන කටයුතු කළ රාජ්‍යයකි,
(1) ඇතැන්ස් (2) ඉන්දියාව (3) ස්විස්ටර්ලන්තය (4) බ්‍රිතාන්‍යය

02. රාජ්‍යයක මූලික ලක්ෂණ දැක්වෙන නිවැරදි පිළිතුර වන්නේ,
(1) ජනගහනය, ආණ්ඩුව, ජනාධිපති, විධායක බලය
(2) භූමිය, ජනගහනය, ආණ්ඩුව, ස්වාධිපති බලය
(3) ජනගහනය, ස්වාධිපති බලය, අධිකරණය, ආණ්ඩුව
(4) භූමිය, ආණ්ඩුව, විරුද්ධ පක්ෂය, ස්වාධිපති බලය

03. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව මහ ඇමතිවරයා ඇතුළු අමාත්‍ය මණ්ඩලය,
(1) හයදෙනෙකුගෙන් (2) පස්දෙනෙකුගෙන්
(3) හත්දෙනෙකුගෙන් 64) හතරදෙනෙකුගෙන් සමන්විත වේ.

04. ශ්‍රී ලංකාවේ පළාත් සභා පිහිටුවීම සිදුවූයේ,
(1) 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනය මගිනි.
(2) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනය මගිනි.
(3) 1948 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනය මගිනි.
(4) 1970 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනය මගිනි.

05. සෘජු ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ පැහැදිලිවම දක්නට ලැබෙන අවස්ථාවක් වන්නේ,
(1) ප්‍රාදේශීය සභා මැතිවරණය (2) ජනාධිපතිවරණය
(3) පාර්ලිමේන්තු මැතිවරණය (4) ජනමත විචාරණය

06. තරගකාරී පක්ෂ ක්‍රමයක් පැවතීම නිසා සිදුවන වාසියක් වන්නේ,
(1) අත්තනෝමතික පාලකයන් බිහිවීම වැළැක්වීම.
(2) හිතකර ක්‍රියාදාමයන් අගය නොකිරීම.
(3) ප්‍රතිවිරුද්ධ මත නියෝජනය නොවීම.
(4) ආණ්ඩු පක්ෂයේ ක්‍රියාදාමයන් විවේචනය කිරීම.

07. පළාත් ආණ්ඩුකාරවරයා සතු කාර්යයක් නොවන්නේ,
(1) පළාත්සභා කැඳවීම හා විසුරුවාහැරීම.
(2) මධ්‍යම ආණ්ඩුව හා පළාත් අතර සම්බන්ධීකරණය.
(3) පළාතේ ආර්ථික හා පරිපාලන කටයුතු සැලසුම් කිරීම.
(4) පළාත් සභාවේ නාමික විධායක ලෙස ක්‍රියා කිරීම.

08. 1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සිදුකරන ලද ප්‍රධානම වෙනස වනුයේ,
(1) පළාත් පාලන ක්‍රමය ඇතිකිරීම.
(2) විධායක ජනාධිපති ධූරය ඇතිකිරීම.
(3) සමානුපාතික නියෝජන ක්‍රමය හඳුන්වාදීම.
(4) ජනමත විචාරණ ක්‍රමය හඳුන්වාදීම.

09. කිසිදු වෙනස්කමකට භාජනය නොකොට අයිතිවාසිකම් හා නිදහස භුක්තිවිඳීමේ හැකියාව හඳුන්වන්නේ,
(1) සමානාත්මතාව (2) යුක්තිය (3) නීතිය (4) සදාචාරය

10. පළාත් සභාවක ආයතනික ව්‍යුහයට අයත් නොවන්නේ,
(1) ආණ්ඩුකාරවරයා (2) මහඇමති
(3) දිස්ත්‍රික් ලේකම් (4) විරුද්ධ පක්ෂය

11. ප්‍රජාතන්ත්‍රවාදී පාලනය වඩාත් සාර්ථක කර ගැනීමට ඉවහල් වන වැදගත් සාධකයක් වන්නේ,
(1) රාජ්‍ය සේවකයන්ට වැඩි වැටුප් දීම. (2) ආණ්ඩු පක්ෂය විවේචනය කිරීම.
(3) නිදහස් ජනමාධ්‍ය පවත්වා ගැනීම. (4) රාජ්‍ය නොවන සංවිධාන පිහිටුවීම.

12. සන්ධිය ආණ්ඩුක්‍රම පවතින රටවලට නිදසුන් ලෙස දැක්වෙන පිළිතුර වනුයේ,
(1) ඇමරිකා එක්සත් ජනපදය, ඔස්ට්‍රේලියාව, ඉන්දියාව
(2) ඉන්දියාව, ස්විස්ටර්ලන්තය, චීනය
(3) ඇමරිකා එක්සත් ජනපදය, ස්විස්ටර්ලන්තය, ඔස්ට්‍රේලියාව
(4) ස්විස්ටර්ලන්තය, කියුබාව, ඔස්ට්‍රේලියාව

13. 15 වන සියවසේ යුරෝපයේ පැවති සමාජ ක්‍රමය,
(1) වැඩවසම් ක්‍රමය (2) සමාජවාදී ක්‍රමය
(3) ඓතිහාසික ක්‍රමය (4) ධනවාදී ක්‍රමය

14. "ප්‍රජාතන්ත්‍රවාද යනු සියලු දෙනාටම අයිතිවාසිකම් හිමිවන ක්‍රමයයි." මෙම ප්‍රකාශය ඉදිරිපත් කළ
(1) ඒබ්‍රහම් ලින්කන් (2) ගානර් (3) සීලර් (4) ඇරිස්ටෝටල්

15. ඒක පක්ෂ ක්‍රමය ක්‍රියාත්මක නොවන රට තෝරන්න.
(1) උතුරු කොරියාව (2) චීනය (3) කියුබාව (4) ඉන්දියාව

16. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකුට ඡන්ද බලය හිමිකර ගැනීමේදී සැලකිල්ලට ගැනෙන නිර්නායක වූ
(1) ස්ත්‍රී / පුරුෂ භාවය (2) රැකියාව හා ආදායම
(3) ජන වර්ගය (4) නියම කරන ලද වයස

17. ශ්‍රී ලංකාවේ පරිපාලන දිස්ත්‍රික් ගණන,
(1) 22 කි. (2) 23 කි. (3) 25 කි. (4) 26 කි.

18. ශ්‍රී ලංකාවේ පාලන ක්‍රමය ක්‍රියාත්මක අතරතුර සෘජුවම ඡන්දදායකයන්ගෙන් අදහස් විමසීමට ලක් ලබන්නේ පහත කුමන අවස්ථාවේදී ද ?
(1) පුනරාවර්තනය (2) ජනමත විචාරණය
(3) මහ මැතිවරණය (4) ප්‍රාදේශීය සභා මැතිවරණය

19. රටක නීන්දු ගැනීමේ ක්‍රියාවලිය සඳහා සියලු දෙනා සම්බන්ධවීම හඳුන්වනුයේ,
(1) සෘජු ප්‍රජාතන්ත්‍රවාදය (2) නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය
(3) නියෝජ්‍ය ප්‍රජාතන්ත්‍රවාදය (4) වක්‍ර ප්‍රජාතන්ත්‍රවාදය

20. ක්‍රි.පූ. 6 වන සියවසේ දී සමූහාණ්ඩු පාලනයක් පැවති ජනපදය වනුයේ,
(1) මගධ (2) කොසොල (3) දෙහිදිව (4) වජ්ජි

1. ප්‍රජාතන්ත්‍රවාදී ජන සමාජයක ජීවත්වන ජනතාව තුළ දැකිය හැකි ලක්ෂණයක් නොවන්නේ,
(1) සාකච්ඡා මගින් තීරණවලට එළඹීම. (2) සමාජ සාධාරණත්වය පිටුදැකීම.
(3) අන්‍ය මත ගරු කිරීම. (4) සමානාත්මතාවය ගරු කිරීම.

2. යහපත් පාලනයක මූලික ගුණාංගයක් දැක්වෙන පිළිතුර කුමක්ද ?
(1) දූෂණයෙන් වංචාවෙන් තොර පාලනය.
(2) රාජ්‍ය සේවය දේශපාලනීකරණය වීම.
(3) රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම කෙරෙහි ජනතා සහභාගිත්වය නැතිවීම.
(4) අනවශ්‍ය ලෙස බලය මධ්‍යගත වීම.

3. එක් මධ්‍යම ආණ්ඩුවක් යටතේ බලය ඒකරාශීව ඇති රාජ්‍ය හැඳින්වෙන්නේ,
(1) ඒකීය රාජ්‍ය (2) සන්ධිය රාජ්‍ය
(3) ජාතික රාජ්‍ය (4) ජනතා රාජ්‍ය යනුවෙනි.

4. උඩව පළාතට අයත් දිස්ත්‍රික්ක වන්නේ,
(1) කුරුණෑගල, පුත්තලම (2) බදුල්ල, මොනරාගල
(3) අනුරාධපුරය, පොළොන්නරුව (4) කෑගල්ල, රත්නපුර

5. ප්‍රජාතන්ත්‍රවාදී පාලනය සාර්ථක කර ගැනීමට විරුද්ධ පක්ෂයෙන් ඉටුවිය යුතු කාර්යභාරය නොවන්නේ,
(1) ආණ්ඩු පක්ෂයේ ප්‍රජාතන්ත්‍ර විරෝධී ප්‍රතිපත්ති වලට හා ක්‍රියාවන්ට විරුද්ධ වීම.
(2) ආණ්ඩුවේ සෑම කටයුත්තක්ම විවේචනය කිරීම.
(3) ආණ්ඩු පක්ෂය විසින් ඉටුකරන යහපත් කටයුතු සාර්ථක කර ගැනීමට සහයෝගය ලබාදීම.
(4) සංවර්ධනාත්මක විවේචන තුළින් ආණ්ඩුව සුමගට යැවීම.

6. සන්ධිය රාජ්‍යයක ප්‍රාදේශීය ආණ්ඩු,
(1) ප්‍රාන්ත ආණ්ඩු ලෙස හඳුන්වයි. (2) රාජාණ්ඩු ලෙස හඳුන්වයි.
(3) පළාත් ආණ්ඩු ලෙස හඳුන්වයි. (4) දිස්ත්‍රික් ලෙස හඳුන්වයි.

7. ශ්‍රී ලංකාවේ ජන්ද කොට්ඨාස බෙදා වෙන්කිරීම සිදු කරන්නේ,
(1) රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගිනි.
(2) මැතිවරණ කොට්ඨාස සීමා නිර්ණය කොමිෂන් සභාව විසිනි.
(3) මැතිවරණ කොමිෂන් සභාව විසිනි.
(4) පළාත් පාලන හා පළාත් සභා ඇමතිතුමා විසිනි.

8. අතෑන්ස් රාජ්‍යයේ ප්‍රධාන පාලන ආයතනය වූයේ,
(1) ගම් සභාවයි. (2) පළාත් සභාවයි. (3) රාජ සභාවයි. (4) පුරවැසි සභාවයි.

9. ශ්‍රී ලංකා ජනරජයේ පරාමාධිපත්‍ය බලය හිමිවන්නේ,
(1) අධිකරණයටයි. (2) අගමැතිතුමාටයි.
(3) ජනතාවටයි. 64) පාර්ලිමේන්තුවටයි.

10. ජනාධිපති ආණ්ඩුක්‍රමය පිළිබඳ කියවෙන අසත්‍ය ප්‍රකාශය වන්නේ,
(1) ජනාධිපති රාජ්‍යයේ නායකයායය.
(2) විධායකය ව්‍යවස්ථාදායකයට සෘජුවම වගකියයි.
(3) ජනාධිපති තෝරා ගනු ලබන්නේ ජනතාවයි.
(4) විධායක බලය හසුරවන්නේ ජනාධිපති විසිනි.

11. ප්‍රජාතන්ත්‍රවාදය පාලන ක්‍රමයක් ලෙස වැදගත් වන ආකාරය පිළිබඳ අදහස් පහත දැක්වේ.
A - නීති සම්පාදනය කරනුයේ මහජන ඡන්දයෙන් තේරී පත්වන නියෝජිතයන්ගේ බහුතර කැමැත්ත මතය.
B - ආණ්ඩු බලය හිමිවන්නේ ජනතා ඡන්දයෙන් වැඩි නියෝජිතයන් තේරී පත්වූ පක්ෂය හෝ කණ්ඩායමය.

C - පාලනය සඳහා නියෝජිතයන් තෝරා පත් කරගනුයේ මහජනතාවගේ කැමැත්තෙන්ය.

ඉහත ප්‍රකාශ සම්බන්ධයෙන් නිවැරදි පිළිතුර තෝරන්න.

(1) A B හා C නිවැරදිය.
(2) A B පමණක් නිවැරදිය.
(3) A C පමණක් නිවැරදිය.
(4) B C පමණක් නිවැරදිය.

32. රටක යුක්තිය පසිඳලීමේ ක්‍රියාදාමය ඉටුකරනුයේ,
(1) ශ්‍රේෂ්ඨාධිකරණයයි.
(2) ව්‍යවස්ථාදායකයයි.
(3) අමාත්‍ය මණ්ඩලයයි.
(4) විධායක ජනාධිපතියි.

33. පළාත් සභා ලැයිස්තු අතුරින් විදේශ කටයුතු ජාතික ආරක්ෂාව යන විෂයන් දක්වා ඇති ලැ වන්නේ,
(1) සංවෘත ලැයිස්තුව
(2) සමගාමී ලැයිස්තුව
(3) පළාත් සභා ලැයිස්තුව
(4) සමාජ සේවා අංශය

34. සන්ධීය රාජ්‍යයක බලය බෙදාහැරීම සිදුවනුයේ,
(1) ජනාධිපති හා මධ්‍යම ආණ්ඩුව අතරය.
(2) ජනාධිපති හා ප්‍රාන්ත අතරය.
(3) මධ්‍යම ආණ්ඩුව හා ප්‍රාන්ත අතරය.
(4) මධ්‍යම ආණ්ඩුව හා ප්‍රාන්ත ආණ්ඩුකාරවරයා අතරය.

35. ග්‍රීසියේ රාජ්‍යයන්වල පුරවැසියන් ලෙස සලකනුයේ,
(1) වැඩිහිටි පිරිමි හා කාන්තාවන් ය.
(2) වැඩිහිටි පිරිමි හා විදේශිකයන් ය.
(3) වැඩිහිටි පිරිමි හා වහලුන් ය.
(4) වැඩිහිටි පිරිමි හා රදළයන්ය.

36. ප්‍රජාතන්ත්‍රවාදී රටක ලක්ෂණයක් සහිත පිළිතුර වන්නේ,
(1) ඉතා උසමස් ආර්ථික මට්ටමක් පැවතීම.
(2) ඒක පක්ෂ ක්‍රමයක් පැවතීම.
(3) ආණ්ඩු පක්ෂයක් හා විරුද්ධ පක්ෂයක් පැවතීම.
(4) නිදහස් හා පක්ෂපාතී ජනමාධ්‍ය පැවතීම.

37. මැතිවරණයක දී මහජනතාවට හිතකර ආණ්ඩුවක් බලයට පත්කර ගැනීමේදී බලපාන සාධකයක් වන්නේ,
(1) සෑම දෙනාටම සමසේ අයිතිවාසිකම් භුක්තිවිඳීමට හැකි වීම.
(2) ජනතාවට දේශපාලනික අවබෝධයක් තිබීම.
(3) නිදහස් හා සාධාරණ මැතිවරණ පැවැත්වීම.
(4) නීතියේ ආධිපත්‍ය රැකීම.

38. ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ අතර ප්‍රථමවරට ශ්‍රී ලාංකිකයන්ට දේශපාලනික වැඩි ඉඩකඩක් ලබා හැකි වූ ප්‍රතිසංස්කරණය වූයේ,
(1) 1931 ඩොනමෝර්
(2) 1833 කෝල්බෘක්
(3) 1921 මැනින්
(4) 1910 කෲව් - මැකලම්

39. මානව හිමිකම් කඩවීමකදී ශ්‍රී ලාංකිකයෙකුට පැමිණිලි කළ හැකි ජාත්‍යන්තර ආයතනය වන්නේ,
(1) ජාත්‍යන්තර කම්කරු සංවිධානය
(2) ජාත්‍යන්තර අධිකරණය
(3) එක්සත් ජාතීන්ගේ ආරක්ෂණ මණ්ඩලය
(4) එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසම්

40. පළාත් සභාවක ප්‍රධාන විධායක නිලධාරියා වන්නේ,
(1) මහඇමතිවරයාය.
(2) ලේකම්වරයාය.
(3) ආණ්ඩුකාරවරයාය.
(4) සභාපතිවරයාය.

PAST PAPERS Wiki

සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

CamScanner

Past Papers Wiki

All Rights Reserved

පුරවැසි අධ්‍යාපනය - II

Name: - ..... Class: -..... Index no: - .....

පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
පළමු ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

1. (1) ඍජු ප්‍රජාතන්ත්‍රවාදය යනු කුමක්ද ?
   (2) බහු පක්ෂ ක්‍රමය ක්‍රියාත්මක වන රටවල් 2ක් ලියන්න.
   (3) රාජ්‍යයන්ගේ ප්‍රධාන ස්වරූප දෙක නම් කරන්න.
   (4) නැගෙනහිර පළාතට අයත් දිස්ත්‍රික්ක 2ක නම් කරන්න.
   (5) පළාත් පාලන ආයතන වර්ග 2ක් නම් කරන්න.
   (6) සන්ධිය රාජ්‍යයක පවතින රටවල් සඳහා නිදසුන් 2ක් ලියන්න.
   (7) පුරවැසියන් සතු නීතිමය යුතුකම් 2ක් ලියන්න.
   (8) බලයේ විවිධ ස්වරූප 2ක් නම් කරන්න.
   (9) නූතන ආණ්ඩුක්‍රම 2ක නම් කරන්න.
   (10) ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයේ දී නියෝජිතයන් තෝරා පත්කර ගන්නා බහුල ක්‍රම 2 ලියන්න.

2. ජනතා අදහස් නියෝජනය වන පාලන ක්‍රමයක් ලෙස ප්‍රජාතන්ත්‍රවාදය පිළිගැනේ.
   (1) ප්‍රජාතන්ත්‍රවාදය යන්න නිර්වචනය කරන්න. (ලකුණු 3)
   (2) ඍජු ප්‍රජාතන්ත්‍රවාදය වර්තමානයේ ක්‍රියාත්මක කිරීමේදී ඇතිවන ගැටලු 2ක් ලියන්න. (ලකුණු 2)
   (3) (අ) ප්‍රජාතන්ත්‍රවාදය ජීවන ක්‍රමයක් ලෙස වැදගත්වන ආකාර 2ක් ලියන්න. (ලකුණු 2)
   (ආ) පන්ති කාමරයේ දී ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ ජීවන ක්‍රමයක් ලෙස කෙතරම් දුරට වැදගත් වන්නේද යන්න උදාහරණ සහිතව විස්තර කරන්න. (ලකුණු 3)

3. තරගකාරී ලෙස පක්ෂ කිහිපයක් වර්තමාන පාලන ක්‍රමයන් තුළ ක්‍රියාත්මක වේ.
   (1) තරගකාරී පක්ෂ ක්‍රමය යනු කුමක්ද ? (ලකුණු 2)
   (2) පක්ෂ ක්‍රමයේ විවිධ ස්වරූප 3 නම් කරන්න. (ලකුණු 3)
   (3) (අ) එම පක්ෂ ක්‍රම වලින් 2 කට උදාහරණ ලියන්න. (ලකුණු 2)
   (ආ) තරගකාරී පක්ෂක්‍රමයක යහපත් ලක්ෂණ 2ක් ලියා එකක් පැහැදිලි කරන්න. (ලකුණු 3)

4. ප්‍රජාතන්ත්‍රවාදී පාලනය සඳහා ජනතා නියෝජිතයින් සම්බන්ධ කර ගැනීමට යොදා ගන්නා උපාය මාර්ගයක් ලෙස ඡන්ද කොට්ඨාසවලට බෙදා වෙන් කිරීම වැදගත් වේ.
   (1) ශ්‍රී ලංකාවේ ඡන්ද කොට්ඨාස බෙදා වෙන් කරන ප්‍රධාන නිර්ණායක 2ක් ලියන්න. (ලකුණු 2)
   (2) ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක අංග ලක්ෂණ 3ක් නම් කරන්න. (ලකුණු 3)
   (3) (අ) රාජ්‍යයකට පැවරෙන කාර්යයන් 3ක් ලියන්න. (ලකුණු 3)
   (ආ) ඉන් එකක් විස්තර කරන්න. (ලකුණු 2)

5. නිදහස සමාජයේ සෙසු සාමාජිකයන්ට අවහිරයක් නොවන සේ භුක්තිවිඳිය යුතුයි.
   (1) නිදහස යන්න හඳුන්වන්න. (ලකුණු 2)
   (2) අයිතිවාසිකම් යනුවෙන් හඳුන්වන්නේ කුමක්ද ? (ලකුණු 2)

CamScanner

(3) (අ) අයිතිවාසිකම් නිසි පරිදි භුක්තිවිඳීමෙන් පුද්ගල සංවර්ධනය තුළින් සමාජ සංවර්ධනය සිදුවන ආකාරය පැහැදිලි කරන්න.

(ආ) ඔබට ලැබෙන අයිතිවාසිකමක් සඳහන් කර ඒ වෙනුවෙන් ඔබ කරන යුතුකම් මොකවාද යන්න ලියා දක්වන්න.

06. මධ්‍යම ආණ්ඩුවේ පරිපාලනය පහසු කරගැනීමේ අරමුණින් පළාත් පාලන ආයතනය පිහිටුවා ඇ

(1) ශ්‍රී ලංකාවේ අතීතයේ පළාත් පාලනය සිදු වූ බවට සාක්ෂි 2ක් ලියන්න.

(2) නූතන රාජ්‍ය බලය බෙදාහැරීමට හේතු 3ක් ලියන්න.

(3) (අ) පළාත් සභාවේ ආණ්ඩුකාරවරයා සතු බලතල හා කාර්යයන් 3ක් ලියන්න.

(ආ) ප්‍රාදේශීය රාජ්‍යයන් වෙත බලය බෙදාහැරීමේදී ඇති වන ගැටලුවක් ලියන්න. එය විස්තර කරන්න.

07. ලෝකයේ බොහෝ රටවල් ක්‍රියාත්මක කරනුයේ ප්‍රජාතන්ත්‍රවාදී පාලනයයි.

(1) වක්‍ර ප්‍රජාතන්ත්‍රවාදය යනු කුමක්දැයි හඳුන්වන්න.

(2) සෘජු ප්‍රජාතන්ත්‍රවාදය අදට නොගැළපෙන්නේ ඇයි ? කරුණු 3ක් ලියා දක්වන්න.

(3) (අ) ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව කටයුතු කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන 2ක් ලියන්න.

(ආ) ඉන් එකක් විස්තර කරන්න.

සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න
CamScanner